ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2014 ජනවාරි 13 සඳුදා
06 වෙළුම - 10 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 36/ News/ 2014

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



Photo By: ASELA DASANAYAKE

ලක්දිව අසහාය ධර්මදූත මුනිවරයා

# ජුසේ වාස් මුනිඳුන් සමරමු !

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# භාගයවත් ජුසේවාස් මුනිඳුන්ගේ දහම් මෙහෙවර ගැන දැනුම්වත් වන්න.

## ආදරණීය දුවේ පුතේ...

පහත සඳහන් අප අසහාය ධර්මදූත වරයාණන් පිළිබඳව කරුණු හොඳට කියවා අවබෝධය ඇති කර ගන්න.

යටත් විජිතවාදි පිපාසාවෙන් වෙලී ගිය පෘතුගීසින් සහ ලන්දේසින් දේශපාලන සතුරෝ වූහ. ලන්දේසීන් සිය යටත් විජිතයන්හි සිටි කතෝලිකයිනට එරෙහිව කටයුතු කළේ හුදු ආගමික හේතුන්ට වඩා දේශපාලනික හේතුන් පාදක කොටගෙනය. තමන් විසින් එළවා හරින ලද පෘතුගීසින් නැවත ආක්‍රමණය කොට තමන් යටතේ පවතින පෙදෙස් අත්පත්කර ගන්නැයි භීතියකින් ලන්දේසිහු පසුවූහ. එයට සාධාරණ හේතු ද තිබුණි. සිංහල රජු හා ලන්දේසීන් විරසකව සිටි හෙයින් "ඉඟුරු දී මිරිස් ගත්තා සේ" යන පදය ද ගෙතුණි. එ නිසා සිංහල රජු තම පෙර යටත් විජිත වාදීන් වූ පෘතුගීසින්ගේ සහය ඇතිව ලන්දේසින් එළවා හරිතියි සැක කළහ. ඒ සැකයට පාදක වූ අනෙක් කරුණ වූයේ ලංකාවට නුදුරින් වූ ගෝවේ පෘතුගීසි බලය තහවුරුව තිබීමය. මේ කරුණු නිසා ශ්‍රී ලාංකේය කතෝලිකයින්ගේ සහය නොමඳව ලැබ තම යටත් විජිතය පෘතුගීසින් අතට නැවතත් පත්වෙතැයි ලන්දේසීහු සැක කළහ. ඒ අනුව ලන්දේසීන් විසින් කතෝලික පීඩනය දැඩිව ක්‍රියාත්මක කළේ ආගමික හේතුනට වඩා දේශපාලනික හේතූන් පාදක කොටගෙනය.

මෙබඳු පරිසරයක එඬේරකු නැති බැටළු රැලක් බවට ශ්‍රී ලාංකේය කතෝලික ප්‍රජාව පත් වූහ. අනෙකුත් ආගමික තහංචි පසෙක තබා පූජක සංහාරය තදින්ම ක්‍රියාත්මක කළේ එමඟින් කතෝලික ජන කොට්ඨාශය දේශපාලනික වශයෙන් අඩපණ කිරීම සඳහා ය. ලන්දෙසිහු එය සාර්ථකව ක්‍රියාවට නැංවූහ. දශක හතරක පමණ කාලයක් කිසිදු පූජකයකු මෙරට කතෝලිකයන්ගේ ආගමික කටයුතු කිරීම සඳහා නොසිටියේ ය. මේ අවස්ථාවේදී ශුද්ධාසනය විසින් නෙදර්ලන්ත රජයෙන් ශ්‍රී ලාංකේය කතෝලික ප්‍රජාවගේ ආගමික කටයුතු ඉටු කිරීම සඳහා පූජකයන් ලංකාවට එවීම සඳහා අවසර පැතීය. එය ද ව්‍යර්ථ විය. මෙරට දහම් පහන නිවී යන අවධියක මේ පසුබිම පිළිබඳ මනා අවබෝධයකින් සහ ශ්‍රද්ධා හැඟුමින් ඉදිරිපත් වූයේ භාග්‍යවත් ජුසේවාස් මුනිඳුන්ය. සිය අනාගත දහම් මෙහෙවර පෞද්ගලික කරුණක් කරගැනීමට එතුමා අදහස් නොකළේය. ඒ අනුව ආසියාකරයේ ප්‍රථම පූජක සංඝය වූ ඔරතෝරියාන පූජක සංඝය ගෝවේ පිහිටුවීය. ඒ සඳහා අවැසි නිත්‍යානුකූල පදනම ලබා ගැනීමට අදහස් කළ ජුසේ වාස් පියතුමා ලිස්බන් නුවර ඔරතෝරියාන පූජක සංඝයේ ව්‍යවස්ථාව පැතීය. පිලිප්නේරි මුනිතුමන් විසින් රෝම නුවර පිහිටුවන ලද "යැදුම් හල" යන අරුතැති ඔරතෝරියාන පූජක සංඝය ගෝවේ නුවර ස්ථාපිත කිරීම, ආසියාවේ එක් රටකින් තව රටකට ධර්මදූතවරු සපයන ප්‍රථම පූජක සංඝය විය. එය ස්ථාවර පදනමක පිහිටුවාලූ පියතුමා ප්‍රථම ආසියාතික ධර්මදූතවරයා ලෙස මෙරටට වර්ෂ 1687 අප්‍රේල් මස පැමිණියේ ය.

මේ අසහාය ධර්මදූතවරයා මුළු විශ්වයීය කතෝලික සභාව ම මුහුණ දී සිටි පැනයට පිළිතුරු දෙමින් මෙරට දහම් පහන දල්වාලීම ඉමහත් ප්‍රාතිහාර්යයකි. ලන්දේසීන් විසින් දියත් කරන ලද පූජක තහංචි එලෙසම පවතිද්දී වරෙක කම්කරුවකු ලෙස ද වරෙක සිඟන්නකු ලෙස ද වෙස්වලාගෙන පා ගමනින් මුළු දිවයින පුරා ඇවිද යමින් සැඟවී සිටි කතෝලිකයින් සොයා ගනිමින් ඔවුනට සක්‍රමේන්තු දානය කිරීම ද, සුභාරංචිය දෙසීම ද කරමින් කිතුනු සංඝ ස්ථාවර පසුබිමක පිහිටුවාලීය. මේ සියල්ල තුළ දේව හස්තය විසින් මෙහෙයවනු ලැබීම අත්දුටු පියතුමාගේ දහම් මෙහෙවරෙහි සාර්ථකත්වය සිදුවූයේ එතුමා සතු පෞද්ගලික ශුද්ධවන්ත දැහැමි දිවි පෙවෙතයි. ඒ බව මහනුවර සිරගෙදර සිටියදී පවා සැමදෙන විසින් මෙන් ම සිංහල රජ ද පසක් කරගත්තේ ය. සිය දහම් මෙහෙවර ස්ථිර පදනමක පිහිටුවාලීමට තරම් භාග්‍යවත් ජුසේ වාස් මුනිඳුන් දූරදර්ශීය. ඒ ඒ කිතුනු සංඝ රැස්කර, ආත්මික ලෙස පෝෂණය කර, ඒවා ගිහි නායකත්වය මත සංවිධානය කළේය. ගිහි නායකයින් "මුහුප්පු", "අන්නාවි", "කානික්ක පිල්ලෙ" යන නාම වලින් හඳුන්වා ඒ ඒ සංඝයන්හි නායකයින් ලෙස පත්කළ අතර සැදැහැවතුන් ද ඔවුන් සිය නායකයින් ලෙස පිළිගත්තේ ය. භාග්‍යවත් ජුසේ වාස් මුනිතුමන් සිය දහම් සේවාවේ දී කිසිදු ආකාර ජන කොට්ඨාශයකට පමණක් සීමා නොවිණි. විශේෂකොට දයාවේ සේවාවන් ඉටුකිරීමේදී කිසිවිටෙක ආගමික පදනමකින් සිය සේවාවන් සීමා නොකළේය. මහනුවර වසූරිය වසංගතය පවතිද්දීත්, නියං උවදුර උඩුදුව තිබියදීත් පොදු යහපත පතා සියලු ජන කොට්ඨාශයනට සේවය කළේය. සිංහල රජුගේ පෞද්ගලික මිතුරකු ලෙස ඉතා සමීපව කටයුතු කිරීමට පියතුමා සමත් විය. ශාස්ත්‍රීය වශයෙන් ද සිය හැකියාවන් මඟින් ජනයාට පොදුවේ සේවය කළේය. මහනුවර රජුගේ ඉල්ලීම පරිදි පෘතුගීසි බසින් ලියැවී තිබූ වෛද්‍ය ග්‍රන්ථයක් සිංහලට පරිවර්තනය කරන ලදි. සිය දූරදර්ශී ක්‍රියා පිළිවෙතට කදිම උදාහරණයක් වන්නේ ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා සාහිත්‍යකරණය සහ භාෂා අධ්‍යයනයට යොමු කිරීමය. එමඟින් දේශීය කිතුනු සාහිත්‍යාවලියක් අපට උරුම කරදීමට සමත් විය.

"සිය ජීවිත කාලයේදී නොකළ දෙය මරණ මංචකයේ දී කළ නොහැකිය." යන විරුදාවලිය පෙරදැරි කොටගෙන දැඩි විශ්වාසයත්, අප්‍රතිහත ධෛර්යයත්, දැහැමි දිවි පෙවෙතත් මඟින් සුවිශාල දහම් මෙහෙවරක් මහා භාරතයේ කනාරාහි සහ ශ්‍රී ලංකාවේ ඉටුකළ මේ මහා ධර්මදූතවරයාණන් දෙවි සමිඳුන් වෙතින් අප ලද මහඟු තිළිණයකි. එවැන්නක් විශ්ව ශුද්ධවූ සභාව විසින් පිළිගනු ලැබීමක් වශයෙන් එතුමන් භාග්‍යවත් දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියාණන් විසින් භාග්‍යවරයට ඔසවනු ලැබීය. භාග්‍යවරයට ඔසවනු ලැබීම යනු එතුමන් සිය ජීවිත කාලයේ දී ඇසුරුකළ පෙදෙස්හි බුහුමන් කිරීමය. විශ්ව ශුද්ධවූ කතෝලික සභාවේ ශුද්ධවරයින් අතරට එතුමන් ඇතුළත් කිරීම සියලු දෙනාගේ ම ඒකායන අපේක්ෂාව යි. භාග්‍යවත් ජුසේවාස් මුනිඳුන් ශුද්ධවර භාවයට එසැවීම සඳහා අවශ්‍ය මූලික ප්‍රාතිහාර්ය ශුද්ධාසනයට ඉදිරිපත් කර ඇත. අප මුනිඳුන්ගේ මැදහත්කමින් එතුමන්ගේ ජිවිත කාලයේදී ප්‍රසිද්ධියේත්, පෞද්ගලිකවත් සිදුකර ඇති ප්‍රාතිහාර්ය අපමණය. එතුමන් ස්වර්ගස්ථ වීමෙන් අනතුරුව ද බොහෝ ප්‍රාතිහාර්ය සිදුකර ඇත.

මේ වසර භාග්‍යවත් ජුසේ වාස් මුනිඳුන්ගේ මංගල්‍යය ශ්‍රී ලාංකේය කිතු බැතිමතුනට සුවිශේෂී වන්නේ ඉමහත් බලාපොරොත්තුවක් පෙරදැරි කොටගෙන යාච්ඤාවේ නිරතවන නිසාය. භාග්‍යවත් ජුසේවාස් ජාතික කාර්යාලය පසුගියදා පැවැත්වූ රැස්වීමේදී විශේෂ මාතෘකාවක් වශයෙන් අවධානයට යොමු කළේ දේශයක් වශයෙන් එක්සත් වී භාග්‍යවත් ජුසේ වාස් මුනිඳුන් ශුද්ධවරයට එසැවීම පතා යාච්ඤා කිරීමය. ලක්දිව සියලුම රදගුරුවසම් හි රදගුරුතුමන් සහ පියතුමන් මේ මස එම මංගල්‍යය පැවැත්වීමට ද සැදැහැවතුන් හා සමඟ යථෝක්ත අදහස උදෙසා දෙවි සමිඳුන් යැදීමට ද සූදානම් ව සිටී. දෙවි සමිඳුන් අප මුතුන් මිත්තනට සහ අප දේශයට දායාද කළ උතුම් තිළිණය වන භාග්‍යවත් ජුසේවාස් මුනිඳුන් ශුද්ධවරයට එසැවීම නොබෝ දිනකින්ම ඉටුවේවායි පතමින් දෙවිඳු යදිමු.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා




## දිව්‍ය සත්ප්‍රසාදය

**(ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමට සූදානම් වන්නන් සඳහායි)**

❖ ප්‍ර: දිව්‍ය සත්ප්‍රසාදයෙහි වැඩ සිටින්නේ කවු ද?

උ: ජේසු ස්වාමිදරුවෝ ය.

❖ ප්‍ර: ජේසු ස්වාමිදරුවන් දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපනය කළේ කවදා ද?

උ: උකුත් වන්නට පෙර දින හෙවත් මහ බ්‍රහස්පතින්දා දිනෙහිය.

❖ ප්‍ර: ජේසු ස්වාමිදරුවන් දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපනය කළේ කෙසේද?

උ: තිරිඟු පූපයක් රැගෙන "මේ මාගේ ශරීරය ය, මෙය රැගෙන අනුභව කරන්න" කියා ද, මිදිරස රැගෙන "මේ මාගේ රුධිරය ය, මෙයින් පානය කරන්න" කියාද, වැදැරීමෙන්ය.

❖ ප්‍ර: ජේසු ස්වාමිදරුවන් මේ වචන වදාළ කල පූපයට කුමක් සිදුවූයේ ද?

උ: පූපය ජේසු ස්වාමිදරුවන්ගේ ශ්‍රී ශරීරයට හැරුණේය.

❖ ප්‍ර: මිදිරසට කුමක් සිදුවූයේ ද?

උ: මිදිරස ජේසු ස්වාමිදරුවන්ගේ ශ්‍රී රුධිරයට හැරුණේය.

❖ ප්‍ර: එසේ නම් දිව්‍ය සත්ප්‍රසාදය ලබන විට ඔබට ලැබෙන්නේ කුමක්ද ?

උ: ජේසු ස්වාමිදරුවන්ගේ ශ්‍රී ශරීරය ද, රුධිරය ද, ආත්මයද දෙවීකය ද මට ලැබෙන්නේ ය.

❖ ප්‍ර: පූපය සහ මිදිරසය ජේසු ස්වාමි දරුවන්ගේ ශ්‍රී ශරීරයටද ශ්‍රී රුධිරයට ද හැරුණ පසු කුමක් ඉතිරි වූයේ ද?

උ: පූපයේ සහ මිදිරසයේ පාට, රස ආදි ගුණ පමණක් ඉතිරි වූයේ ය.

❖ ප්‍ර: දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපනය කළ පසු ජේසු ස්වාමිදරුවෝ කුමක් වදාළ සේක් ද?

උ: "මා සිහිකිරීමක් වශයෙන් මෙය කරන්නැ"යි වදාළ සේක.

❖ ප්‍ර: මේ වචන වලින් උන්වහන්සේ කුමක් සිදුකළ සේක්ද?

උ: පූපය සහ මිදිරස උන්වහන්සේගේ ශ්‍රී ශරීරයට ද ශ්‍රී රුධිරයටද හැරවීමේ බලය හෙවත් පූජකවරය දුන්සේක.

❖ ප්‍ර: ඒ බලයෙන් පූපය සහ මිදිරස ජේසු ස්වාමි දරුවන්ගේ ශ්‍රී ශරීරයට ද, ශ්‍රී රුධිරයට ද හරවනු ලබන්නේ කොයි වේලාවේ දී ද?

උ: ජේසුස්වාමිදරුවන් නියම කළ වචන පූජාප්‍රසාදීතුමන් දිව්‍ය පූජා වේලෙහි උච්චාරණය කරන විට ය.

❖ ප්‍ර: දිව්‍ය පූජාව නම් කුමක් ද?

උ: තිරිඟු පූප සහ මිදිරස ප්‍රකාරයෙන් ජේසු ස්වාමිදරුවන්ගේ ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරය යාගයක් කොට දෙවියන් වහන්සේට ඔප්පු කිරීම ය.

❖ ප්‍ර: දිව්‍ය පූජාවට සහභාගි වීමට ඉතා හොඳ ක්‍රමය කුමක් ද?

උ: පූජාප්‍රසාදී තුමන් සමඟ එකඟව ජේසු ස්වාමි දරුවන් හා සම්බන්ධ වෙමින් දෙව් පියාණන්ට තමන් ඔප්පු කර ගැනීමය.
දිව්‍ය සත්ප්‍රසාදය ලැබීම ය.

❖ ප්‍ර: දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමට කළ යුතු සූදානම කුමක්ද?

උ: 1. ඉෂ්ට වරප්‍රසාදයෙන් සිටීම ය.
2. යහපත් අදහසක් ඇතිව සිටීමය
3. දිව්‍ය සත්ප්‍රසාද ලැබීමට පැයකට පෙර සිටවත් සත්ප්‍රසාද ලබන තුරු කිසි ආහාරයක් නොකා සහ දියර ආහාර වර්ගයක් නොගෙන ද සිටිය යුතුය. යමක් මිශ්‍ර නොවූ ස්වභාවික වතුර කොයි වේලාවෙහි හෝ බීමට තහනමක් නැත.

❖ ප්‍ර: දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමට පෙර තමන් කළ යුතු දේ කුමක් ද?

උ: තමා ලබන්නට යන ජේසු ආදරයෙන් සිහි කිරීම විශ්වාසයේ හා බලාපොරොත්තුවේ ද දේවප්‍රේමයේ සහ පසුතැවිලි වීමේද යාච්ඤා මුළු හෘදයෙන් කීමය.

❖ ප්‍ර: දිව්‍ය සත්ප්‍රසාදය ලැබූ ජේසු ස්වාමිදරුවන්ට ස්තුති කරන්නේ කොහොම ද?

1. තමා තුළට වැඩම කළ ජේසු සමිඳුන්ට වන්දනා කිරීමෙන් ය.
2. තමා නැවත උන්වහන්සේට ඔප්පු කර ගැනී මෙන්ය
3 තමා තුළ නැවතී තමාට උදව් වන ලෙස උන් වහන්සේගෙන් ඉල්ලා සිටීමෙන් ය.
4. අනුන් උදෙසා යාච්ඤා කිරීමෙන් ය.

❖ ප්‍ර: දිව්‍ය සත්ප්‍රසාද ලැබීමෙන් ප්‍රයෝජන ලබා ගත් බව පෙන්වන්නේ කොහොමද?

උ: තම කල්පනා, වචන සහ ක්‍රියා, ජේසු ස්වාමිදරුවන්ගේ කල්පනා වචන සහ ක්‍රියා වලට සමාන කර ගැනීමෙන්ය

❖ ප්‍ර: දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමට ඔබ ආශාවිය යුත්තේ මන්ද?

උ: ජේසු ස්වාමිදරුවන් මට ප්‍රේම කරන නිසාත් මා උන්වහන්සේට ප්‍රේම කළ යුතු නිසාත් ය

# කජු පුහුලං පාඩම

ස්වභාවික පරිසරය තරම් ගැලපෙන තැනක් නැහැ උගන්වන්න. ඒක මම අත්දැකීමෙන්ම දැනගත්ත දෙයක් දහම් පාසලේ 11 වසරට මම ඉගැන්වුයේ පල්ලිය පිටුපස කජුගහ යට ගල් බංකුවේ ඉඳන් ඒ ඉගැන්වීමට සුදුසුම පරිසරයක් කියල හිතල නෙමේ. අපේ දුප්පත් පල්ලියේ ඒ සඳහා ඩෙස්බංකු තියන පංතිකාමර පහසුකම් නොතිබුන නිසා කොහොම උනත් ගල් බංකුව නිදහස් පංති කාමරයක් උනත් කජුගහේ කජු හැදෙන කාලෙට පංති කෙරුවා නම් ටිකක් අමාරුයි. කොයි වෙලේ වවුල් හපයක් වැටෙයිද දන්නේ නැහැ. එහෙමනැත්තන් අත්තෙන් අත්තට පනින තඩි දඹුලේන්නු බාගෙට කාපු හොඳට ඉදුණු කජු පුහුලන් ගෑනු ළමයින්ගේ ඇඟට වට්ටන්නේ හිතලම ද මන්ද මම සමහර වේලාවට මනමාල දඹුලේනට බනින කොට කෙල්ලො ටික හිකි හිකි ගාලා හිනාවෙනවා."අපි කජු පුහුලන් කමු" දවසක් පංතිය අතරමැද්දේදි මම යෝජනා කළා "හා " කොල්ලෝ කෙල්ලෝ එක පයින්. පිරිමි ළමයි ටික ඉදුණු පුහුලන් කැඩුවා ගෑනු ළමයි පල්ලියේ කුස්සියට ගිහින් ලුණු, ගම්මිරිස් එහෙම යහමින් දාල පුහුලන් ටික කපලා හදාගෙන ආවා.... සුවාමිට නොපෙනෙන්න දඹු ලේනාට පෙන්න පෙන්න අපි කජු පුහුලන් කෑවා කජු පුහුලන් රස කටේ තියාගෙනම මම එදා දවසෙ පාඩම ඉවරකළා" "අපි හැමෝම ජීවත්වෙන්න ඕනා එකමුතුකමෙන්, සහෝදර ප්‍රේමයෙන් පුංචි පුංචි දේවල් පවා බෙදාහදාගෙන ජීවත් වෙන කොට ජීවිතේට පුදුමාකාර සතුටක් ලැබෙනවා. එකිනෙකාට ආදරය කරමින් ජීවත් වෙන්න කජු පුහුලන් උගන්වපු පාඩම ඒක තමයි. දැන් උ/පෙළ අවසන් වසරෙ ඉන්න එයාලට මම එදා දහම් පාසලේ උගන්වපු ඒ පාඩම මතකද දන්නේ නැහැ.

**නිලූෂා ඇන් (ආචාර්ය මඩුල්ල)**
ශු. පවුලේ දහම් පාසල - රාජකදළුව



ඔවදනක්

# නව වසරට සිතුම් පැතුම්

දුවේ පුතේ, වසරක් ගෙවී ගියා නව වසරක් උද වුනා. ගෙවී ගිය වසර ගැන ඔබට මොකද හිතෙන්නේ? ජීවිතයෙ ජය ගැනිම් පැරදීම්, වැරදීම්, දුක් ආදෝනාවන් වලට මුහුණ දුන් අවස්ථා, විවිධාකාර අභියෝගයන් වලට මුහුණ දුන් අවස්ථා ඇති නේද? දැන් ඒ සියල්ල අමතක කරන්න එයින් ලැබු අත්දැකීම් පමණක් ජීවිත කෙතට පොහොර කර ගන්න. නව වසරේ මුල සිටම නව හැඟුමෙන් නව බලාපොරොත්තු වලින් ඔබේ හදවත පුරවාගන්න. ඔබ සතු හැකියාවන් , ශක්තීන් ප්‍රබලතා හඳුනා ගන්න. ඒවා දියුණු කර ගන්න. ඒ තුළින් තමන්ගේ පෞද්ගලිකත්වය සහ පෞරුෂත්වය ගොඩනගා ගන්න අවස්ථාවක් කර ගන්න අතරම යම් සමාජ මෙහෙවරක යෙ-දෙන්න.

උදා: තමන් දන්නා දේ තවත් කෙනෙකුට කියලා දෙන්න. නිර්මාණකරණය තුළින් අන් අයගේ හදවත් සුවපත් කිරීම. හැකියාවට සහ ලැදියාවට අනුව විෂය ධාරාවන් තෝරාග න්න. යහපත් ඉලක්ක අරමුණු ගොඩනගා ගෙන කාලය සැලසුම්කරගෙන නිරන්තරයෙන්ම එයට අදළ ක්‍රියාකාරකම් වල යෙදෙන්න. මේ සැම කට යුත්තකදීම දෙගුරුන්ගේ ආශිර්වාදය වගේම දේව ආශිර්වාදයද වැදගත් වන බව අමතක කරන්න එපා "හිටියොත් හොඳට හැඳි දෙවියොත් නමට වඳියි" කියල කියමනක්ද තියෙනව කෙසේ වෙතත් මේ වසර දෙවි ආසිරි බහුල

"සුබ නව වසරක් වේවායි" ඔබ සියලු දෙනාටම ප්‍රාර්ථනා කරමි.

**පී.ඒ. නිමාලි ප්‍රනාන්දු** - ගුරු මව

## තූර්ය වාදක තරගයකින් වැලිවිට ශාන්ත මරියා විදුහලට අනුශුරතාවය.

ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය විසින් සංවිධානය කරන ලද බස්නාහිර පළාත් තූර්යවාදක තරගයේදී වැලිවිට ශාන්ත මරියා විදුහලේ තූර්ය වාදක කණ්ඩායමට අනුශුරතාවය හිමිවිය. ජයග්‍රාහි තූර්ය වාදක කණ්ඩායමේ පිරිස විදුහල් පතිනි උත්තරා ලියනගේ මිය (මැද) තූර්යවාදක කණ්ඩායම භාර සොනාලි ගුරු මහත්මිය සහ ගරු මේරියන් එවුස්ට්‍රා ප්‍රනාන්දු සොයුරියද සමග ළමා ප්‍රදීපය සඳහා සමූහ ඡායාරූපයකට මුහුණ දුන් අවස්ථාව.

**එම් ජෝ. පාරිස්.**



# ලොවට එළිය පුංචි අපයි........ අපට එළිය ජේසු තුමයි !

ජනවාරි 26 වන දිනට යෙදෙන
ළමා ධර්මදූත ඉරුදින නිමිත්තෙනි.

ආදර දුවේ, පුතේ, මේ ලෝකයේ ආලෝකවත් කරන්නට පුංචි ඔබගේ ජීවිත ගොඩාක් වටිනවා. ඒ නිසාම තමයි. ශුද්ධාසනීය ධර්මදූත සංගමය විසින් මෙවර ළමා ධර්මදූත තේමාව ලෙස තෝරාගෙන ඇත්තේ. '' ලොවට එළිය පුංචි අපයි..... අපට එළිය ජේසු තුමයි....'' යන්න.

**ධර්මදූත ළමා සමාජයේ දූ පුතුන්ට පමණක් නොව ලක් දෙරණ ඉන්න සියලුම දූ පුතුන්ටයි මේ ආරාධනය. ජේසුස් වහන්සේව හඳුනන, ජේසුස් වහන්සේ තුළ ජීවත්වෙන උන්වහන්සේව අන් අයට හඳුන්වාදෙන පුංචි ධර්මදූතයෝ අද භය නැතිව කියන්නේ ''ලොවට එළිය පුංචි අපයි. අපට එළිය ජේසු තුමයි'' කියලා. අද ඒ ගොල්ලන්ට එහෙම කියන්න පුළුවන් වෙලා තියෙන්නේ ඔවුන්ගේ පුංචි ජීවිත තුළ ජේසුස් වහන්සේ ගොඩක් සමීපයෙන් අත්දැකලා තියෙන නිසයි.....**

**ඔව්, මල්වැනි පුංචි ඔබ ලෝකයේ ආලෝකයයි. මේ අප ලෝකය ආලෝකමත් කරන්නට පුංචි ඔබගේ ජීවිත ගොඩක් වටිනවා... ඒවගේම පුංචි ඔබගේ ජීවිත තුළින් මේ ලෝකයට වෙනසක් ගෙන දෙන්නට පුංචි ඔබට පුළුවන්. බලන්න පුංචි ඔබ කොතරම් අගේද කියලා.....**

**ඉතින් දුවේ, පුතේ, ඔබත් කැමති නැද්ද ජේසුස් වහන්සේව හඳුනාගනිමින්, උන්වහන්සේ තුළ ජීවිත් වෙමින්, ඒවගේම එතුමන්ව අන් අයට අඳුන්වා දෙන පුංචි ධර්මදූතයන් වෙන්නට ........ පුංචි ඔබට අද ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ආරාධනා කරනවා එතුමන්ගේ ආලෝකයෙන් ඔබ ජීවිත බබලවන්නට ඉඩහරින්න . ඒ ආලෝකයෙන්ම මේ ලෝකය එළියකරන්නට.**

**ඉතින් දුවේ, පුතේ, ''ලොවට එළිය පුංචි අපයි, අපට එළිය ජේසු තුමයි'' යන ළමා ධර්මදූත තේමා පාඨය මේ වසර පුරාවටම ඔබ ජීවිත තුළ ජීවත් කරවන්නට ඔබට හැකිකම්, අනිවාර්යෙන්ම, මේ ලෝකය එළිය කරන්නටත් ඔබට හැකිවේවි...... ඔබ ජීවිත වල ආලෝකය ජේසුස් වහන්සේ බව විශ්වාස කරන්න.....**

**ගරු ශාමේන් පැට්‍රික් සොහොයුරිය** - (අ.කා.නි )

# ළමා ප්‍රදීපයෙන් ලේඛන කලාවට පිවිසි දෙවිසත්හල් සිසුවකුගෙන් වාර්තා චිත්‍රපටයක්






ළමා ප්‍රදීපයෙන් ලේඛන කලාවට අත් පොත් තැබූ කොහුවල සා. ජෝශප් නි.ම.නි. දෙවිසත්හලේ ඉගෙනුම ලබන බුරුල්ලපිටිය මීසමට අයත් ලක්ෂාන් ප්‍රනාන්දු පසුගියදා ''ශු. ඌගෝ මුනි ඉතිහාසය හා දෙව් මැදුරු ඉතිහාසය'' යන නමින් වාර්තාමය චිත්‍රපටයක් එළිදැක්විය. මෙහි පළමු පිටපත බුරුල්ලපිටිය මීසම් සේවක ගරු සුභාෂ් චමින්ද (නි.ම.නි.) පියතුමාට පිළිගැන්විය.

මෙම වාර්තා චිත්‍රපටයෙහි ශු. ඌගෝ මුනි ඉතිහාසය, බුරුල්ලපිටිය ශු. ඌගෝ මුනි දේවස්ථානයේ ඉතිහාසය හා ශු. ඌගෝ මුනිදුන්ගේ මැදිහත්කමින් සැදැහැවතුන් අත් දුටු ප්‍රාතිහාර්යයන් ද ඇතුලත්ය. මෙහි මිල රු 250 කි.

ලක්ෂාන් ප්‍රනාන්දුට ළමා ප්‍රදීපය සුබ පැතුම්.

**(කුමර නයනජිත්)**

# දහම් පාසල් ත්‍යාග ප්‍රදානෝත්සව

මත්තුමගල ශ්‍රී හෘදයේ දහම් පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය පසුගියදා දේවස්ථාන භූමියේ දී පැවැත් වුණි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ.

**මර්වින් ඒ.ජෝශප් - වත්තල**





බත්තරමුල්ල පාතිමා දහම් පාසලේ වසර අවසාන ත්‍යාග බෙදාදීමේ උත්සව දින ඉදිරිපත් කළ නත්තල් නාට්‍යය සේයාරුවෙහි දිස්වේ.

**සටහන :- නෙවිල් ඇන්ටනි පෙරේරා / සේයා - සුදත් රණසිංහ**

රද්දොලුව සාන්ත සිසිලියා දහම් පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය මීසම් ශාලාවේදී මීසම් සේවක ගරු ප්‍රසාද් පෙරේරා පියතුමන්ගේ සහ ප්‍රවීන සංගීතඥ , ගායක අයිවෝ ඩෙනිස්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මෙදින දහම් පාසලේ දැරියන් පිරිසක් රංගනයක යෙදුනු අවස්ථාව මෙහි දැක්වේ. **රන්ජිත් ලොකුපෝතාගම**





නාත්තන්ඩිය ලූර්දු මාතා දහම් පාසලේ නත්තල් උත්සවය හා ත්‍යාග පිරිනැමීම පසුගියදා සිදු කෙරෙනි. එහිදී 9 ශ්‍රේණියේ ළමුන් ඉදිරිපත්කල ''ගවළෙන් තරගය'' කෙටි නාට්‍ය-යේ අවස්ථාවක් ළමා ප්‍රදීපය කැමරාවට හසුවූ අයුරු.

**ශ්‍රියාංගණී ෆිලීෂියා**




මෝදර සාන්ත අන්තෝනි බාලිකා ප්‍රාථමික විදුහලේ නත්තල් උත්සවය විද්‍යාලීය ශාලාවේදී පැවැත්වුණි.

විදුහල්පති මානෙල් ගෝමිස් මහත්මියගේ හා ආචාර්ය මණ්ඩලයේ මගපෙන්වීම යටතේ මෙය සංවිධානය කෙරෙනි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ. **රනිල් රාජපක්ෂ - මෝදර**



මිදෙල්ලවිට මීසමේ යක්කඩුව දේවස්ථානයේ ළමෝ 26 ක් ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ. දිව බොදුන් ලැබූ දරු දැරියන් සමග මීසම් සේවක ගරු ටෙරන්ස් කිත්සිරි පියතුමා ගරු පැවිදි සොහොයුරිය දහම් පාසල් ගුරු මණ්ඩලය සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු. **ඒ. කැලිස්ටස් ඇන්ටනි.**






බොල්ලත සිරිහද දහම් පාසලේ ළමුන් 23 ක් පසුගියදා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ.

දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූ ළමුන් මීසම් සේවක ගරු බර්නාඩ් රෙහාට් ආරාධිත ගරු ඇන්ටන් ජයනන්ද පියතුමන්ලා සහ ගරු පැවිදි සොහොයුරිය සමග ළමුන් ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

**අජිත් කමල්ප්‍රිය ජයලත්**



කලමුල්ල මීසමේ දහම් පාසල් හි ළමෝ 74 ක් පසුගියදා පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. දේව මෙහෙය ගරු ලෙස්ටර් විජේසූරිය පියතුමාගේ ප්‍රධානත්වයෙන් මීසම් සේවක ගරු ලෝරන්ස් රාමනායක මීසම් සහයක ගරු අසංක ප්‍රියනාල් පියතුමන්ලාගේ සහභාගිත්වයෙන් කලමුල්ල දේවමාතා දෙව් මැදුරේදී පැවැත්වුණි ගරු පියතුමන්ලා,ගරු පැවිදි සොහොයුරියන් ද ළමුන් පුහුණු කළ දහම් පාසල් ගුරු භවතුන්ද සමඟ ළමුන් ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයා රුවකට පෙනී සිටි අයුරු.

**සටහන :- ඈන් ප්‍රනාන්දු / සේයා :- ස්ටුඩියෝ රනිල්**

# ආසියාවෙන් බි
# අසහාය ධර්ම

**බෙනුවාලිම්**



ගෝවා පුරයේ සැල්සෙට් ප්‍රදේශයේ, බෙනුවාලිම්, වර්ෂ 1651 අප්‍රේල් මස 21 වැනි දින ජුසේ වාස් පියතුමා උපත ලද්දේය. ජුසේ වාස් පියතුමාගේ දෙමව්පියන් වූයේ ක්‍රිස්ටෝපර් වාස් හා මරියා මිරැන්ඩා නැමති බ්‍රාහ්මණ කුලයේ කොන්කානි බැතිමත් ඉන්දියානු යුවලක්ය. ජුසේ වාස් පියතුමා උපත ලද්දේ ගෝවා පුරයේ සැල්සෙට් ප්‍රදේශයේ, බෙනුවාලිම්හි පිහිටි තම මව් පාර්ශවයේ මිත්තනුවන්ගේ නිවසේදී ය.



**බෙනුවාලිම්හි පිහිටි ශු. ස්නාවක ජුවාම් මුනිඳුන්ට කැපවූ දේවස්ථානය**

ජයසින්ත් පෙරේරා පියතුමා විසින් 1651 අප්‍රේල් මස 28 වැනි දින බෞතීස්ම කරන ලදී. ඒ බෙනුවාලිම්හි පිහිටි ශු. ස්නාවක ජුවාම් මුනිඳුන්ට කැපවූ දේවස්ථානයේය.

**සැන්කෝලයේ පිහිටි තම පියාගේ නිවස**



ඔහුගේ ළදරු අවධිය පිළිබඳ දත් තොරතුරු ඔහුගේ දක්ෂතා හා මහත් වූ භක්තිය හෙළි කරයි. ඔහුගේ සම වයසේ දරුවන් කෙළිදොලින් කාලය ගත කරද්දී ඔහු වඩාත් ප්‍රිය කළේ නිසල ස්ථානයකට වී යාච්ඤා කරන්නටය. දිනපතා දේව මෙහෙයට සහභාගි වූ ඔහු පූජ්‍යප්‍රසාදිතුමා දිව්‍ය සත්ප්‍රසාදීන් වහන්සේ රෝගීන් වෙත ගෙන යන අවස්ථාවලටද සහභාගි විය. එසේම මළවුන් සොහොන් භූමිය වෙත ගෙන යන අවස්ථාවලට සහභාගි වීම වඩාත් ප්‍රියකල මොහු, රාත්‍රී කාලයේ දැන හඳුනන සියල්ලන් වෙත ගොස් ඔවුන්ගේ යාච්ඤා වලටද විශේෂයෙන් මළවුන් වෙනුවෙන් යාච්ඤා ඔප්පු කරන මෙන් ඉල්ලා සිටියේය. එකල සැන්කෝලයේ විසූ වයස්ගත

පුද්ගලයෙකු වූ අන්තෝනියෝ කර්ඩෝසෝ කුඩා ජුසේ පිළිබඳව නිතර පැවසූ දෙයක් නම් ''අහෝ සැන්කෝලය, නුඹට උරුම වූ වූ ආශිර්වාදය පිළිබඳව නුඹ නොදන්නෙහිය. එහෙත් උතුම් වූ දෙවිපියාණන් වහන්සේ විසින් විසින් ඔහුගේ දෙමව්පියන් වෙත දුන් පොරොන්දුව ඉටුකරන දිනයක් පැමිණෙනු ඇත'' යන්නයි. ඔහුට මහත් ආදරයක් දැක්වූ ගැමියෝ ඔහු ඇමතුවේ ''ශුද්ධ වූ ළදරුවා'' යන නමිනි.

**කෝර්ටාලිම් ගමේ පිහිටි ශු. පිලිප් හා සිමියොන් යන අපෝස්තුළුවරුන්ට කැපවූ දේවස්ථානය**



යාච්ඤාවේ නිරත වීමට මෙතුමානන්ට වේලාවක් නොවීය. ඇතැම් අවස්ථා වලදී රාත්‍රී කාලයේ පවා දේව ලැදියාව නිසාම මෙතුමා තම පියාගේ නිවසට යාබද කෝර්ටාලිම් ගමේ පිහිටි ශු. පිලිප් හා සිමියොන් යන අපෝස්තුළුවරුන්ට කැපවූ දේවස්ථානයට ගියේය. මෙතුමා මෙම දේවස්ථානයට යන කල්හි එහිදී වසා තිබූ දේවස්ථානය මෙතුමා අත තැබූ සැනින්ම විවෘත වූ බව සඳහන් වේග

**ෆ්‍රැන්සිස් සේවියර් මුනිවරයානන්ගේ සිරුර**



ගෝවේ හි අනෙකුත් දේවස්ථාන හා සැසඳීමේදී ගෝවේ සාන්ත ෆ්‍රැන්සිස් සේවියර් මුනිවරයානන්ගේ දේහය තැන්පත් කොට තිබූ බැවින්, කතෝලිකයන් හට වැදගත් ස්ථානයක් විය. තරුණ ජුසේ වාස් හට ශු. ෆ්‍රැන්සිස් සාවියෙර් මුනිඳුන්ගේ දේහය දකින දකින සෑම විටම එතුමානන්ගේ අරමුණ වූයේ මෙතුමා මෙන් ධර්මදූත මෙහෙවරේ යෙදී සමිඳුන් උදෙසා තම මුළු දිවියම දෙවිඳුන්ට පුද කිරීමටය.

**ගෝවේ ආසන දෙව්මැදුර**

ඉතා උසස් ලෙස තම අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කිරීමෙන් පසු ගෝවේ හි අගරදගුරු මොන්සිඤෝර් අන්තෝනියේ

# හිවූ අග්‍රගණ්‍ය දූතවරයාණෝ

බ්‍රන්දවෝ හිමිපාණන් විසින් තරුණ ජුසේවාස් පූජකවරයාට දිවියට ආලේප කරන ලදී. මේ සමගම ධර්මය දේශනා කිරීමේ කාර්‍යයද ජුසේ වාස් පියතුමා වෙත පවරන ලදී. ඒ ක්‍රි.ව 1676 දීය.

**සැන්කෝලේ ආරෝග්‍ය අප ස්වාමිදුගේ දෙව්මැදුර**



ක්‍රි.ව. 1677 අගෝස්තු 06 වන දින එනම් තුෂාරයේ අප ස්වාමිදුවගේ මංගල්‍ය දින සැන්කෝලේ දෙව්මැදුරේ ආරෝග්‍ය අප ස්වාමිදුගේ අල්තාරය මත එතුමන් රචිත පොරොන්දු පත්‍රයයි. මෙමගින් ජුසේවාස් මුනිදුන් තමන් වහලෙකු ලෙස මරියෝත්තමාවන්ට කැපවීමේ සලකුණක් ලෙස තමන්වම එතුමියට පවරා දුන් ලියවිල්ලකි. අද මේ දෙව්මැදුරේ මොගොප්පුව පමණක් ඉතිරිව තිබෙන අතර, අකුණු සැරක් වැදිම හේතුවෙන් දේවස්ථානයේ ඉතිරි ගොඩනැගිලි විනාශ වි ඇත.

**මුඩිප්පු**



තවද බැංගලෝර් හි සේවය කරන කළ ජුසේවාස් පියතුමා ප්‍රකට දේශනාවාදියෙකු විය. මෙතුමන්ගේ දේශනා වල ප්‍රතිඵලයක් ලෙසින් සැලකිය යුතු පිරිසක් (හින්දු හා මුස්ලිම් ජනයා) කිතු දහම වැළඳගත්තෝය. හින්දු අන්තවාදීන්ට මෙය ඉමහත් තර්ජනයක් විය. මේ නිසා ම අන්තිම ආලේපනයක් දානය කරනු පිණිස එක් රාත්‍රියක පැමිණි පිරිසක් එතුමා හුදකලා කන්දක් මතට ගෙන ගිය අතර එහිදී එතුමන්ට පහර දී මරන්නට යන බව එතුමන්ට වැටහිණි. වහාම එම දාමරික පිරිස අමතා ''මා මරන්නට පෙර දෙවිදුන්ට යාච්ඤා කිරීමට වේලාවක් දෙන ලෙස ඉල්ලා සිටියේය'' එහිදී එතුමන්ට දණ ගසා සිටි ස්ථානයෙන් හා තම සැරයටිය ගැසූ ස්ථානයෙන් දිය උල්පත් වහා ගලා ආවේය. මේ හියම ශුද්ධවන්තයෙක් බව තේරුම්ගත් දාමරිකයෝ වහා පලා ගියෝය. මුඩිප්පු නමින් ප්‍රසිද්ධ මෙම කඳුමුදුනේ අදටත් ජල උල්පත් දක්නට ලැබේ. එය අද සුප්‍රකට වන්දනා ස්ථානයකි.

**ගෝවේ ශු. පිලිප්නේරි මුනිඳුන්ගේ ඔරතෝරියාන නිකාය**



ගෝවේ ප්‍රදේශයට පැමිණ එහි වූ ස්වාධීන පූජක සංඝයක බැඳුණු ජුසේ වාස් පියතුමා ක්‍රි.ව. 1685 සැප්තැම්බර් 25 වන දින එය ශු. පිලිප්නේරි මුනිඳුන්ගේ ඔරතෝරියාන නිකාය බවට පත් කරන ලදී. තවද භෞතික වශයෙන් එහි පූජකහලක් ද,දෙවිසත්හලක්ද පිහිටු වූ එතුමාණෝ එමඟින් අදහස් කළේ, ලංකාව කරා ධර්මදූතවරු බිහිකරන ස්ථානයක් කරන්නට ය. එහි සිට වසර 150 ක් පුරාවට ලක් දෙරණට ධර්මදූතවරු පැමිණියේ මේ නිකාය තුළිනි. එය ආසියාවෙන් බිහි වූ පළමු ස්වාධීන පැවිදි නිකායයි.

**ප්‍රාතිහාර්යය කුරුසිය**



ජුසේවාස් මුනිඳුන්ව පෙළඹවූ කුරුසිය විය. ක්‍රි. ව 1619 දී ජේසු සමිඳුන් පණපිටින් මෙම ශ්‍රී කුරුසිය මත සිටිනු බොහෝ දෙනෙකු දුටු අතර, මේ නිසාම මෙහි අසංඛ්‍යාත ප්‍රාතිහාර්යයන් සිදු විය. දින ගණන්, පැය ගණන් රාත්‍රියේ මේ ප්‍රාතිහාර්යමය සිරි කුරුසිය පාමුල වැද වැටී තම පූජක දිවියේ යථාර්ථයද ලංකාව තුළ දේව ජනතාවගේ ආත්මික අවශ්‍යතා ද සොයා බලා ඔවුන් පෝෂණය කරන බවට ද එතුමාණෝ දිව්රා පොරොන්දු වූයේ මේ කුරුසිය පාමුලය. ඇතැම් දිනවල දෙව්මැදුරින් වූ හැඩීම් ශබ්දය හා ඉකිබිඳීමේ හඬ ශබ්දයන්ට තිගැස්සුනු ඇතැම් පියවරු දේවස්ථානයට පැමිණ විපරම් කර බැලීමේදී ඔවුන් දුටුවේ මහත් විශ්වාසයෙන් හා භය භක්තියෙන් ශ්‍රී කුරුසිය හා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියේ දණින් වැටී ඉකිබිඳිමින් හඬමින් දෙවිඳුන්ගේ මහඟු සුරැකියාව සොයන යාචකයෙකු ලෙස හඬ නගන ජුසේවාස් පියතුමාය.

**සේයා හා සටහන - අසේල දසනායක**



## පෙර පාසල් විවිධ ප්‍රසංග

පමුණුවිල ශු. ජුසේ මුනිඳුගේ දහම් පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදනෝත්සවය හා විවිධ ප්‍රසංගය පසුගියදා පැවැත්විනි.

වැලිවේරිය මීසම් සහයක ගරු ලලිත් තිසේරා පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙය සඳහා දළුගම මීසම් සේවක ගරු ජුඩ් ශ්‍යාමන්, සහයක ගරු දිනුෂ් ගයාන් පියතුමන්ලා ගරු ගීත් ගයාන් සොහොයුරුතුමාද, දළුගම ශු. පවුලේ කන්‍යාරාමයේ පැවිදි සොයුරියන්ද මෙහි මුලසුන් හෙබවීය. මෙදින ළමුන් ඉදිරිපත් කළ විශේෂංගයක් ඡායාරූපයේ දිස්වේ. **ඩී.එල් බැසිල් ආර්.පෙරෝ**





**දියලගොඩ සාන්ත බෙර්නාදෙත් පෙර පාසලේ දරු දැරියන්ගේ වාර්ෂික විවිධ ප්‍රසංගය බේරුවල මීසම් සේවක ගරු චමින්ද රොෂාන් පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් දියලගොඩ රෝ.ක. ප්‍රාථමික විදුහලේදී පැවැත්වුණි. මෙදින ළමුන් ඉදිරිපත් කළ විශේෂාංගයක් සේයාරුවෙහි දිස්වේ.**

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**



මීගමුව මාරිස්ටෙල්ලා විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ සිසුදරුවන් නත්තල් කැරොල් ගායනයකට එක්වූ අයුරු

**රේමන් අපොන්සු**

## හලාවත පදවියේ ධර්මදූත සජීවක නත්තල් උත්සවය

හලාවත පදවි ධර්මදූත සජීවක නත්තල් උත්සවය පසුගියදා පැවැත්වුණි. පුත්තලම් මීසම් සේවක ගරු ජෙයරාසා මීසම් සහයක ගරු ෂෙහාන් ෆර්ඩිනන්ඩස් පියතුමන්ලාගේ හා පදවි ධර්මදූත අධ්‍යක්ෂ ගරු නිශාන්ත ජානක පියතුමාගේද සහභාගිත්වයෙන් පැවැත්වුණි. පදවියේ දිසා හතරට අයත් සජීවක සජීවිකාවන් මීට සහභාගී වූ අතර මෙම උත්සවය පුත්තලම් දිසා ධර්මදූත සජීවක සජීවිකාවෝ එක්ව සංවිධානය කළහ. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ.

**කොකුම් වාසනා ජයරුවන්**



# ක්‍රිස්තියානි ඉතිහාසයේ අසිරිය 38

## රෙපරමාදු ආභාෂයෙන් බිහි වෙන නව චින්තන රටා

පසුගිය ලිපිය හා සබැඳේ

### III විද්‍යාත්මක දේවවාදය

විද්‍යා ආගමිකයන් ගැටුණේ සම්ප්‍රදායානුකූල සභා සමග පමණක් නොවේ. සභා සමග ගැටුණට වඩා තදින් ඔවුන් ගැටුනේ රජය සමග ය. රජවරුන්ට රාජ්‍ය බලය ලැබුණේ දෙවියන්ගෙන් යැයි යන එතෙක් බහුලව පිළිගැනුණු විශ්වාසය මොව්හු තදින්ම විවේචනයට ලක් කළහ. එය පදනම් රහිත එකක් සේ බැහැර කළහ. පියුරිටානුවාදීන් මෙන්ම මොව්හුද රාජ්‍ය පාලන ක්‍රමය අහෝසි කර එය වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් බිහි කළ යුතුයැයි කියා සිටියහ. ඒ අනුව ගත් විට මොව්හු රජවරුන්ගේ ප්‍රධාන එදිරිවාදීන් වූහ. එසේ වුවද මොව්හු එක් අරමුණක් සඳහා රජවරුන් හා එක් වූහ. දෙපක්ෂයටම පොදුවූ ඒ අරමුණ ක්‍රිස්තියානි සභාව විනාශ කිරීම ය. විද්‍යා ආගමිකයින්ට ක්‍රිස්තියානිය විනාශ කිරීමට ඕනෑ වුයේ ඔවුන් එය විශ්වාස නොකළ නිසා ය. රජවරුන්ට එය විනාශ කර දැමීමට ඕනෑ වුයේ තම පාලන තන්ත්‍රයට යටත් කර ගත නොහැකි ආයතනයක් තම රාජකීය මායිම් තුළ වැජඹෙණු දැකීමට ඔව්නු අකමැති වූ නිසාය.



### ජේසුයිට් සංවිධානය අහෝසි කිරීම

එම පොදු පරමාර්ථය ඉටුකර ගැනීමට දෙපක්ෂයේම පහර ගැසීම්වලට එකසේ තෝරා ගත හැකිවූ එක ඉලක්කයක් විය. ඒ ඉලක්කය ජෙසුයිට්වරු විය. මේ වන විට, ජේසුයිට් සංවිධානය සාමාජිකයින් 22,500 කින් පමණ සමන්විත විය. කතෝලික සභාවේ ආරක්ෂක හටයින් සේ සැලකිය හැකිවූ මෙම ජෙසුයිට් පියවරු අතිශයින් උගතුන් වූහ. පාප්තුමන් වෙත පක්ෂපාතීත්වය ජෙසුයිට්සංවිධානයේ විශේෂ ලක්ෂණයක් ද විය. එවැනි පිරිසක් විනාශ කර දැමීමට රජවරු හා විද්‍යා ආගමිකයෝ එක්වීම, තේරුම් ගැනීමට දුෂ්කර දෙයක් නොවේ ජෙසුයිට්වරුන් නැති කර දැමිය හැකි නම් කතෝලික සභාවේ පාලනය තම අතට ගත හැකි යැයි රජවරු විශ්වාස කළහ ජේසුයිට්වරුන් නැති කර ගත හැකි නම් ක්‍රිස්තියානිය සදහටම මෙලොවින් තුරන් කර දැමිය හැකි යැයි විද්‍යා ආගමිකයෝ සිතූහ.

ජෙසුයිට්වරුන්ට පහර ගැසීම ඇරඹුණේ පෘතුගාලයෙන් ය. එසේ වීමට විශේෂ හේතුවක් විය. මේ වන විට පෘතුගීසීහු දකුණු ඇමරිකාවේ ''පැරගුවායි'' යන රට අල්ලා ගෙන එය තම යටත් විජිතයක් කර ගෙන සිටියහ. රතු ඉන්දියානුවන් වශයෙන් හැඳින්වුන එහි වැසියන්ට ලියන්න කියන්න දැනුමක් තිබුණේ නැත. එම නිසා ඔවුන් යටත් කර ගෙන රටේ ධනයද රටවැසියන්ගේ ශ්‍රමය හුරා කෑමද ඔවුන්ට එතරම් දුෂ්කර කාර්යයක් නොවී ය. ඉන්දියානුවනට විඳීමට සිදුවූ පීඩාව දුටු ජෙසු නිකායික පියවරු ඔවුන් ආරක්ෂා කිරීමට විශාල පරිශ්‍රමයක් දැරූහ. ජෙසුයිට්වරුන්ගේ මැදිහත්වීම වැලැක්වීමට ඔවුන්ට එරෙහිව විවිධ චෝදනා නගා, ඔවුන් පෘතුගාලයෙන්ද, පෘතුගාලයට අයත් හැම යටත් විජිතයකින්මද, පන්නා දැමීමේ ආඥාවක් රජතුමා 1759 දී නිකුත් කෙළේ ය. එය ක්‍රියාත්මක කිරීමට පටන් ගැනීමත් සමගම හැම ජෙසුයිට්වරයෙක්ම අල්ලා හිරකරනු ලැබුණේ ය.

ඉන්පසු ඔවුන්ගේ සමහරු පිටරටවලට පවනු ලැබුණේ ය. සමහරු බන්ධනාගාරවලම මිය ගියහ. ඔවුන්ගේ වාසස්ථාන හා දේපල රාජසන්තක කරනු ලැබුණේ ය. පෘතුගීසීන්ගේ ක්‍රියාදාමයෙන් කුපිතවූ රතු ඉන්දියානුවෝ පාලකයින්ට විරුද්ධව කැරලි ගසන්නට පටන් ගත්හ. විශාල සංඛ්‍යාවක් මරුමුවට පත්කරමින් පෘතුගීසි පාලකයෝ ඉතාමත් කෲර විලාශයකට එම කැරැල්ල මැඩ පවැත්වූහ.

යුරෝපයේ වෙනත් රජවරු පෘතුගාලයේ ක්‍රියාව ආදර්ශයට ගත්හ. ජෙසුයිට්වරුන් පන්නා දමා ඔවුන්ගේ දේපල රාජසන්තක කළහ. ප්‍රංශයේ රජ 1744දී ද ස්පාඤ්ඤයේ රජ හා නපෝලියේ රජ 1767 දී ද එසේ කළහ. ඉන්පසු පාප්තුමා ලවා ජෙසුයිට් සංවිධානය සම්පූර්ණයෙන්ම වසා දම්මවා ගැනීමට මොව්හු ප්‍රයත්න දැරූහ. ජෙසුයිට් සංවිධානය අහෝසි කරන මෙන් පාප් තුමාගෙන් ඉල්ලා සිටිමින් තම ඉල්ලීමට අවනත නොවුවහොත් 8 වෙනි හෙන්රි රජ කළාක් මෙන් තමන්ද මේ රටවල් පාප් පාලනයෙන් ඉවත් කර ගන්නා බවට තර්ජනය කළහ. 14 වෙනි ක්ලෙමන්ට් පාප් තුමාට ඒ ඉල්ලීමට ඉඩ නොදී සිටීමට නොහැකි විය.

ඉදිරියට .......

**සංස්කාරක පියතුමන් විසිනි**



**අලි රංචුවක්**

**අමාෂ දෙව්මි ප්‍රනාන්දු**

08 ශ්‍රේණිය
සා. මිඛායෙල් අග්‍රදූත දහම් පාසල
නාගොඩ, කළුතර



**ජේසුස් වහන්සේගේ බෞතිස්මය**

**ජනිත් ආලෝක සිල්වා**

04 ශ්‍රේණිය
සාන්ත ජෝශප් විදුහල (මීගමුව ශාඛාව)

## පුංචි අපේ චිත්‍ර පිටුව



**දෙවිඳුන්ට යාච්ඤා කරමු**

**අදීෂා නිහාරි ෆොන්සේකා**

02 ශ්‍රේණිය
ජයලත් අප ස්වාමිදුගේ කන්‍යාරාම - මොරටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම, පංතිය, පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.
"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**අපේ ගෙදර**

**මසිත් රමේන්**

ශා. පේදුරු පාවුළු දහම් පාසල - ඉරබඩගම



**ගමක අසිරිය**

**තරුෂිකා නෙත්මි විරසිංහ**

04 ශ්‍රේණිය
සිරිකුරුස විදුහල - ගම්පහ



**මල් මෝස්තරයක්**

**සදාශනි පෙරේරා**

11 ශ්‍රේණිය
ශු. ජපමාල මාතා දේවස්ථානය
බණ්ඩිරිප්පුව

# ශු. ඇග්නස් මුනිවරිය



## සුදුවර චරිතයක් හඳුනාගනිමු

තරුණ වියේදීම ප්‍රාණපරිත්‍යාගීවූ කන්‍යාවියන් ලෙස ඇග්නස් මුනිතුමිය ශු. සභා මාතාවට ඉතා උසස් ගෞරවයක් දක්වන්නීය. ඇය කුඩා කල සිටම දෙවියන් වහන්සේ කෙරෙහි ගැඹුරු විශ්වාසයකින් යුක්තව පිරිසිදු ජීවිතයක් ගත කළ බව කියවේ.

ඇගේ 12 වන උපන් දිනය සැමරූ ඇය තම මව්පියන් කැටුව දිව්‍ය පූජාවට ගොස් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්තීය. දිව්‍ය පූජ්‍යවෙන් පසු රදගුරුතුමන් පාමුල දණින් වැටී තම මුළු ජීවිත කාලය තුළදීම කන්‍යා භාවය රැකගැනීමට සහ තම ජීවිතයම ජේසුස් වහන් සේට කැප කලාය. එදිනම සවස රෝමානු ආණ්ඩුකාරයාගේ පුත්‍රයා ඇය විවාහ කරගැනීමේ අදහසින් ඇයට වටිනා තෑග්ගක් එව්ය. ඇය එම තෑග්ග ප්‍රතික්ෂේප කරමින් මෙසේ කීවාය. "මම ස්වර්ගීය රජාණන්ගේ පුතණුවන් වන ජේසුස් ක්‍රිස්තු තුමන් සමග විවාහ වී ඇත." මෙය සැලවූ වහාම රෝමානු ආණ්ඩුකාරයාගේ පුත්‍රයා කිපී ඇය සිරභාරයට ගැනීමට නියම කළේය.



රෝමානු භටයෝ පැමිණ ඇය ඇදගෙන ගොස් සිරගෙට දැමූහ. එහිදී ඇයට බොරු දෙවිවරුන්ගේ දේවතා රූප වලට මල් සහ දුම් පිදීමට , හිරිහැර කර නොයෙක් වද හිංසා කරමින් බලකර සිටියෝය. ඇග්නස් තරුණිය නොසෙල්වී ජේසුස් වහන්සේ වෙත සිත සහ දෑත් ඔසවමින් යාච්ඤාවෙහි යෙදුනා මිස, ඒ අද මිටුවනට කීකරු වුයේ නැත.

ආණ්ඩුකාරයාගේ තරුණ පුතා පැමිණ මේ සියලු වද හිංසා වලින් ඇය ගලවන බවට පොරොන්දු වී තමා සමග විවාහ වන ලෙස ඇයගෙන් නැවත ඉල්ලා සිටියේය. ඇග්නස් පිලිතුරු දෙමින්, "මාගේ ගැලවුම් කාර ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට පමණක් මා අයිතිය" යි කීවාය. ඇගේ වදන් ඇසූ තරුණයා කිපී ඇය මරන්නට අණ කළේය.

මෙම දිරිමත් තරුණිය ඉදිරියේ සිටි සොල්දාදුවා එක කඩු පහරින් ඇය මරණයට පත් කළේය. ඇය අන්තිමය දක්වා ජේසුස්වහන්සේට විශ්වාසවන්තව සිටියාය. ඇගේ මෘත ශරීරය රෝමයෙන් පිට ඇගේ පවුලේ සොහොනෙහි තැන්පත් කළේය. එය දැන් ඇගේ නම දරණ බිංගෙයකි. ජනවාරි මස 21 වන දින ශු. සභා මාතාව ඇයගේ මංගල්‍යය පවත්වන්නීය.

**අසේල දසනායක**

---

# මාසික සිතිවිල්ල



සේයා
කුමර නයනජිත්

## ජයග්‍රාහී නිර්මාණය
### "දෙසැම්බර් මාසය"

මරිය වසර ඇවිදින් මරි මව් පුදන්නට
එතුමියගෙන් ලැබෙන ආරාධනයයි, යාච්ඤා කරන්නට
යමු අපි සැම ජපමාලය අතැතිව එතුමිය යදින්නට
වෙමු අපි සැම එතුමියගේ හද රැඳි දරුකැළ

සඳුෂා ප්‍රනාන්දු
9 ශ්‍රේණිය
සා. මරියා දහම් පාසල - කටුකුරුන්ද. මොරටුව

මාසික සිතිවිල්ල



"ජනවාරි මාසය"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

සේයා
ටෝනි නිශාන්ත ප්‍රනාන්දු

## ප්‍රහේලිකා අංක 41




### හරහට

1. අධෛර්ය නොවී නොකඩවා යාච්ඤා කළ යුතු බව පෙන්වීමට ......... හා විනිශ්චකාරයා පිළිබඳ උපමාව ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක, මෙහි හිස්තැනට සුදුසු වචනය.

4. ශුද්ධවූ සභාවේ පනත් සංඛ්‍යාව

6. දෙවිපියාණන් අපට දී ඇති හැකියාවන් වර්ධනය කර දේව රාජ්‍යය වෙනුවෙන් යෙදවිය යුතු බව පෙන්වීමට ..... දසය පිළිබඳ උපමාව ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක . මෙහි හිස්තැනට සුදුසු වචනය.

8. තම ....සතුටු කරන තැනැත්තේ සමිඳුන්ට කීකරු වන්නේය. යනුවෙන් උපදේශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

11. අග්‍රදූතයන්ගෙන් එක් කෙනෙකි.

### පහළට

1. සදොම් සහ ගොමෝරා නුවරවල් .... වලක්වාලීමට ආබ්‍රහම් තුමා දෙවිපියාණන් ඉදිරියේ මැදිහත් විය. මෙහි හිස්තැනට සුදුසු වචනය.

2. ක්‍රිස්තුන් වහන්සේ සිදුකළ විවිධ ප්‍රාතිහාර්යයන් නිසා උන්වහන්සේ පිළිබඳ පුවත...... පැතිරී ගියේය. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ගිනිගත් නොදැවෙන පඳුර මැදින් දෙවිඳුන් මෝසෙස්ට කථා කරමින් ''ඔබේ පාද වලින් ..... ගලවා දමන්න''. ඔබ සිටින ස්ථානය ශුද්ධ භූමියෙකැ'යි වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

5. ක්‍රිස්තුන් වහන්සේ ස්වර්ග රාජ්‍යයේ ..... ශු. පේදුරු තුමාට පැවරූ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

7. බදු පොළේ සිටි මෙම අයකැමියාට ක්‍රිස්තුන් වහන්සේ ''මා අනුව එන්න ''යයි වදාළ සේක.

9. කානා නුවර විවාහ මංගල්‍ය අවස්ථාවේදී ක්‍රිස්තුන් වහන්සේ මේවා මිදි යුෂ බවට හැරවූ සේක.

10 මේවා ගසා මරා දැමීම සඳහා පව්කාර ස්ත්‍රීය මිනිසුන් විසින් ක්‍රිස්තුන් වහන්සේ වෙතට ගෙන ආවේය.

(මෙම ප්‍රහේළිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු. ලූක් 5/27,18, 9/11 ශු. මාක් 1/40 , ශු. ජුවාම් 8, උපදේශකයා හෙවත් සිරාක් 3/6, උත්පත්ති18/16, නික්මයාම 3/5

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා** - කිරිමැටියාගාර

## නව වසරට සිතුවිල්ලක්



**මෙලොව ඉපිද**
**උරුම කරගත් මනු දිවිය**
**දෙවිදුන්ගෙන් ලද තිළිණයකි**
**එය ගෙවී යයි කාලය සමඟ**
**දුක, සතුට මුසුව**
**එහෙත් මුළු ලොව කුරිරුව**
**අප දෙස බලා සිටින විට**
**හදවත සැලෙයි අප**
**තනි වූ විගස**
**නමුත්, ධෛර්යමත්,**
**එඩිතර හදවතට**
**ජය ගත හැකියි**
**දෙවිදුන් තුළ ඒ අඳුරු ලෝකය**

**නිමේෂා මධුමාලි සමරකෝන්**
13 ශ්‍රේණිය
ශා. අන්තෝනි මහා විද්‍යාලයය - අලගොල්ලෑව

### ඔබ එළිදක්වන පොත්පත් වලට අපෙන් ඉඩක් ...

ඔබ පාසලේ, මිසමේ දහම් පාසලේ එළි දක්වන, ළමා පොත්, සඟරා හා පුවත් පත් පිළිබඳව තොරතුරු අපට ලියා එවන්න. ඒවා ළමා ප්‍රදීපයේ පළ කිරිමට අපි සූදානම්. එම විස්තර පහත ලිපිනයට යොමු කරන්න.

**"පොත් පත්"**
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත - කොළඹ 08


ශුද්ධවූ බයිබලය ඇසුරෙනි
මෝසෙස්
35
චිත්‍ර කථා රචනය ආනන්ද කල්දේරා.
මෝසෙස් සෙවිට ආරොන්ට දුන්නේය.. ඔහු නයිල් නදියේ.. ජලයට සෙවිටෙන් පහර දුන් කල එම ජලය ලේ බවට හැරුණි
ඔහ්.. මා මෙසේද දැන් සන්තානය.. ..කරන්නෙ.. මේ ලේ ගංගාවෙ මට නාන්ඩ බැහැ.. මා දැන් මොනාද කරන්නෙ...?
ඊජිප්තු ජනතාව නයිල් ගඟ අසලට..
ඇත් ගඟේ වතුර ලේ පාටයි..
ගඟේ වතුර බොන්න බැහැ... ..පිළී.. ගඳයි..
ඔවු.. මේ ලේ වතුර බොන්න පුළුවන්ද...?
මෙන්න.. ගඟේ මාළු.. ඔක්කොම මැරිල පාවෙනවා
අපිට බොන්න වතුර ..ගන්න.. ළිං.. හාරන්න වෙයි...
ඊජිප්තු පාරාවෝගේ විජ්ජාකාරයන්ද හාස්කමක් කර නයිල් නදියේ ජලය පෙර පැවති තත්වයට පත් කළේය.
මෝසෙස්.. අපි දැන් මොකද කරන්නේ.. රජතුමා හන්තු තීරණේ වෙනස් කරන්නෙ නෑ.. ඔහු දැඩි ලෙසම එම තීරණේම සිටිනවා...
රජතුමනි.. අප නැවතත් වරෙක් ඉල්ලා සිටින්නේ, දෙවියන් වහන්සේගේ අණට කීකරු වන.. ..ලෙසයි..
බැහැ.. දැන් ඒක කොහොමත කරන්න බැහැ.. ඔය සෑම දේම බොරු දැක්කනෙ මගෙ.. විජ්ජාකාරයන් කළ දේවල්...

ළමා ප්‍රදීපය


ගල්ගමුව


මාරවිල සිද්ධස්ථානය

# භාග්‍යවත් ජුසේ වාස් පියතුමන්ගේ පාද ස්පර්ශය ලැබූ ස්ථාන

සටහන / ඡායාරූප:
අසේල දසනායක


සෙට්ටිකුලම්


වහකෝට්ටේ


කල්ලෙයි කඩ්ඩයිකඩු ශ්‍රී කුරුසිය


මානියංගම පැරණි ලී භාණ්ඩ


පරපාන්කන්ඩල් දෙව් මැදුර


වෑ උඩ දෙව්මැදුර